# ආරක්ෂක අමාත්‍යාංශය
# பாதுகாப்பு அமைச்சு
# MINISTRY OF DEFENCE

අංක. 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03, ශ්‍රී ලංකාව.
இல. 15/5, பாலதக்ச மாவத்தை, கொழும்பு 03, இலங்கை.
No. 15/5, Baladaksha Mawatha, Colombo 03, Sri Lanka. Website : www.defence.lk

මගේ අංකය / எனது இல / My No } MOD/DEF/GS/SALW/4/SLA (1)

ඔබේ අංකය / உமது இல / Your No }

තැ. පෙ. / த. பெட்டி / P.O. Box } 572 | දුරකථන / தொலைபேசி / Telephone } 2430860-9, 2430870-8 | ලේකම් / செயலாளர் / Secretary } දුර./தொ./Tel. : 011 2381154, ෆැක්ස්./பெ./Fax.: 011 2541529, වි. තැපෑල./மி.அ./Email : secdefence@defence.lk

දිනය / திகதி / Date } 2020.07. 1


ආරක්ෂක අමාත්‍යාංශ චක්‍රලේඛ අංක : MOD/01/2020

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි
යුද්ධ හමුදාධිපති
නාවික හමුදාධිපති
ගුවන් හමුදාධිපති
පොලිස්පති

**යුධමය වාතාවරණය පැවති වකවානුවේ ක්‍රියාන්විත ප්‍රදේශ වල හා ක්‍රියාන්විත ප්‍රදේශ ලෙස නම් නොකරන ලද ප්‍රදේශ වල රාජකාරියේ යෙදී සිටියදී සෘජුවම ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් හෝ ත්‍රස්ත ක්‍රියා මැඩ පැවැත්වීම උදෙසා සිදුකරන ලද ක්‍රියා හේතුවෙන් ආබාධිත වූ හා මියගිය ත්‍රිවිධ හමුදා, පොලිස් හෝ විශේෂ කාර්ය බලකා සාමාජිකයින් සඳහා ඔවුන්ගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වනතෙක් ගෙවන ලද වැටුප් හා දීමනා, මියගිය සාමාජිකයාගේ යැපෙන්නන් ජීවත්ව සිටින තෙක් හා ආබාධිත සාමාජිකයා ජීවත්ව සිටින තෙක් ලබාදීම.**

උක්ත මැයෙන් ගරු ආරක්ෂක අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අංක MOD/CP/DEF /53/2019 හා 2019.03.12 වන දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලබාදෙන ලද අංක 19/0973/103/069 හා 2019.05.21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව පත් කරන ලද කමිටුව විසින් ලබා දුන් නිර්දේශ සහ එකී කමිටු නිර්දේශ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ අංක MF/NB/CM/368/2019/103/17 හා 2019.09.19 දිනැති නිරීක්ෂණයන් සමඟ සලකා බැලීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලය විසින් අංක අමප/19/2618/103/069-I හා 2019.09.24 දිනැතිව සෘජුවම යුද්ධයට දායකවීම හේතුවෙන් හෝ පෙර පැවැති යුධමය වාතාවරණයේ ප්‍රතිඵලයක් ලෙස සිදු වූ පශ්චාත් යුධ ක්‍රියාකාරකම්වලට දායකවීම හේතුවෙන් ආබාධිත වූ ත්‍රිවිධ හමුදා, පොලිස් හෝ විශේෂ කාර්ය බලකා සාමාජිකයින් සඳහා පහත පරිදි දීමනා ගෙවීමට තීරණයකර ඇත.

**2. හිමිකම් ලබන පාර්ශ්වයන්**

මෙම චක්‍රලේඛයේ ප්‍රතිලාභ හිමිගැන්වීමට 2009.05.19 දිනට පෙර යුධමය වාතාවරණය පැවති වකවානුවේ සෘජුවම යුද්ධයට දායකවීම හේතුවෙන් හෝ පෙර පැවැති යුධමය වාතාවරණයේ ප්‍රතිඵලයක් ලෙස සිදු වූ පශ්චාත් යුධ ක්‍රියාකාරකම්වලට දායකවීම හේතුවෙන් පහත දැක්වෙන අවස්ථාවන්හිදී ආබාධිත වූ ත්‍රිවිධ හමුදා, පොලිස් හෝ විශේෂ කාර්ය බලකා සාමාජිකයකු විය යුතුය.

I. 2009.05.19 දිනට පෙර පැවති යුද්ධයට සෘජුවම දායක වීම හේතුවෙන් ආබාධිත වීම.

II. 2009.05.19 දිනට පෙර පැවති යුධමය වාතාවරණයේ ප්‍රතිඵලයක් ලෙස සිදු වූ පශ්චාත් යුධ ක්‍රියාකරකම්වලට දායක වීම හේතුවෙන් ආබාධිත වීම.

232

### 3. ගෙවීම් සිදුකළ යුතු ආකාරය

උක්ත 2 හි සඳහන් හිමිකම් ලබන පාර්ශ්වයන් සඳහා වයස අවුරුදු 55දී ගෙවිය යුතු වැටුප් හා දීමනා හෝ ඉන් පසුව විශ්‍රාම ගියේ නම් විශ්‍රාම ගිය දින අවසන් වරට ලැබූ වැටුප් හා දීමනාවල එකතුව හා වයස අවුරුදු 55දී හිමිගන්වන විශ්‍රාම වැටුප හෝ ඉන්පසුව විශ්‍රාම ගියේ නම් එම දිනට හිමි විශ්‍රාම වැටුප අතර වෙනස ස්ථාවර මාසික දීමනාවක් ලෙස මෙහි පහත දැක්වෙන ආකාරයට ගණනය කර විශ්‍රාම වැටුපට එකතු කර ගෙවිය යුතුය.

3.1 2009.05.19 දිනට පෙර පැවති යුද්ධයට සෘජුවම දායකවීමෙන් හෝ පෙර පැවති යුධමය වාතාවරණයේ ප්‍රතිඵලයක් ලෙස සිදුවූ පශ්චාත් යුධ ක්‍රියාකාරකම්වලට දායක වීම හේතුවෙන් ආබාධිතව සේවයෙන් ඉවත්ව එහෙත් වයස අවුරුදු 55 සම්පූර්ණ කර නොමැති ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගේ වයස අවුරුදු 55 සම්පූර්ණවන දිනට හිමිගන්වන වැටුප් හා දීමනාවල එකතුවත් ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගේ වයස අවුරුදු 55දී හිමිගන්වන විශ්‍රාම වැටුපත් අතර වෙනසට සමාන ස්ථාවර මාසික දීමනාවක් විශ්‍රාම වැටුපට අමතරව ආබාධිත සාමාජිකයින් ජීවත්ව සිටින තෙක් පමණක් ගෙවිය යුතුය (ඇමුණුම -I).

3.2 2009.05.19 දිනට පෙර පැවති යුද්ධයට සෘජුවම දායකවීමෙන් හෝ පෙර පැවති යුධමය වාතාවරණයේ ප්‍රතිඵලයක් ලෙස සිදුවූ පශ්චාත් යුධ ක්‍රියාකාරකම්වලට දායක වීම හේතුවෙන් ආබාධිතව වයස අවුරුදු 55 සම්පූර්ණ වීමට ප්‍රථම සේවයෙන් ඉවත්ව මේ වන විට වයස අවුරුදු 55 සම්පූර්ණ වී විශ්‍රාම වැටුප් ලබමින් සිටින ආබාධිත ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගේ වයස අවුරුදු 55 සම්පූර්ණවන දිනට හිමිගන්වන ලද වැටුප් හා දීමනාවල එකතුවත් ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගේ වයස අවුරුදු 55දී හිමිගන්වන ලද විශ්‍රාම වැටුපත් අතර වෙනසට සමාන ස්ථාවර මාසික දීමනාවක් විශ්‍රාම වැටුපට අමතරව ආබාධිත සාමාජිකයින් ජීවත්ව සිටින තෙක් පමණක් ගෙවිය යුතුය (ඇමුණුම -II).

3.3 ඉහත 2 ඡේදයෙහි සඳහන් විධිවිධාන යටතේ මෙම ස්ථාවර මාසික දීමනාව ලබාගැනීමට සුදුසුකම් ලබනුයේ ශ්‍රී ලංකා පොලිසියේ හෝ විශේෂ කාර්ය බලකායේ සාමාජිකයකු නම්, එම සාමාජිකයා වයස අවුරුදු 55 හෝ වයස අවුරුදු 55 ත් 60 ත් අතර කාලය තුළ විශ්‍රාම ගනු ලබන්නේ නම්, එම සාමාජිකයා විශ්‍රාම ගනු ලබන දිනට ඔහුට හිමි විශ්‍රාම වැටුපත් ඔහු අවසන් වරට ලැබූ වැටුප් හා දීමනාවල එකතුවත් අතර වෙනස ස්ථාවර මාසික දීමනාව ලෙස හිමිගැන්විය යුතුය.

### 4. ඉහත හිමිකම් ලබන පාර්ශ්ව සඳහා මෙම චක්‍රලේඛයේ විධිවිධාන පරිදි ප්‍රතිලාභ ලබාදීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂයෙන් අවධානය යොමුකළ යුතුය.

4.1 මෙම චක්‍රලේඛයේ විධි විධාන පරිදි ප්‍රතිලාභ ලබාගැනීමේදී ආබාධයට ලක්වන සාමාජිකයාට වයස අවුරුදු 55 වන තෙක් ගෙවනු ලැබූ වන්දි අත්හිටුවීම සිදුවිය යුතුය.

4.2 ඉහත කාණ්ඩයට අදාළව යම් නිලධාරියෙකු මෙම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක වන දින වන විටත් විශ්‍රාම ලබා ඇත්නම්, එම සාමාජිකයාට මෙම හිමිකම ලැබෙනුයේ ඔහුගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වන දිනය හෝ ඉන්පසුව විශ්‍රාම ගියේ නම් විශ්‍රාම ගිය දිනය පදනම් කර ගෙනය.

4.3 මෙම චක්‍රලේඛ විධි විධාන පරිදි ප්‍රතිලාභ සඳහා හිමිකම ලැබෙනුයේ අමාත්‍ය මණ්ඩලය විසින් මෙම දීමනාව අනුමත කරන ලද 2019.09.24 දින සිට වන අතර එදින සිට පමණක් හිඟ වැටුප් සඳහා හිමිකම ඇත්නම් හිඟ වැටුප් ගණනය කරනු ලැබේ.

4.4 යෝජිත දීමනාව ලැබීමට සුදුසුකම් ලබන නිලධාරින්ට පමණක් අවුරුදු 55න් පසු ගෙවනු ලබන රණවිරු සුරැකුම් දීමනාව අත්හිටුවීම සිදුකළ යුතුය.

4.5. ප්‍රතිලාභ ගණනය කිරීමේදී මෙහි පහත දක්වා ඇති පරිදි දුබලතා විශ්‍රාම වැටුප ද ඒකාබද්ධ කර ගණනය කිරීමට කටයුතු කළ යුතුය.

4.6 මෙම චක්‍රලේඛයේ විධිවිධාන බල පැවැත්වෙනුයේ මෙහි දැක්වූ හිමිකම් ලබන පාර්ශ්වය ජීවත්ව සිටින තාක්කල් පමණි.

4.7 ත්‍රිවිධ හමුදා, පොලිස් හෝ විශේෂ කාර්ය බලකා සාමාජිකයින් වෙත වැටුප් හා දීමනා ගෙවීම් සිදු කල ආකාරයටම මෙම ස්ථාවර මාසික දීමනාව ද ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය මගින් ගෙවීම් කිරීම සිදු කළ යුතු අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අදාළ ආයතන ප්‍රධානීන් විසින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් තම වැය ශීර්ෂය වෙත ගෙන්වා ගත යුතුය.

4.8 කලින් කලට සිදුවන වැටුප් සංශෝධනයන්හිදී හැර විශ්‍රාම වැටුප හා මෙම ස්ථාවර මාසික දීමනාවේ එකතුව නිලධාරියකුගේ වයස අවුරුදු 55 හෝ ඉන්පසුව විශ්‍රාම යන දිනට ලැබූ මුළු වැටුප් හා දීමනාවල එකතුව ඉක්මවා නොයා යුතුය.

> 4.8.1 එමෙන්ම කාලීනව රජයන් විසින් ගන්නා ප්‍රතිපත්තිමය තීරණයන් මත විශ්‍රාම වැටුප හෝ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපෙහි සංශෝධනයන් සිදුකළ හැකි අතර ඉහත පරිදි ගණනය කරන ලද ස්ථාවර මාසික දීමනාවේ අගය නොවෙනස්ව පැවතිය යුතුය.

4.9 අංක අමප/19/2618/103/069-I හා 2019.09.24 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහයේ පවත්නා විධි විධානයන්/රෙගුලාසිවලට අගතියක් නොවන පරිදි නව විධි විධාන/රෙගුලාසි ඇතුළත් කරමින් 19 සහ 28 (යුද්ධ), 16 සහ 25 (නාවික), 16 සහ 25 (ගුවන්) යන වගන්ති සහ ත්‍රිවිධ හමුදා වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් රෙගුලාසි සහ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයෙහි වගන්ති සංශෝධනය කළ යුතු අතර විශේෂ කාර්ය බලකාය හෝ පොලිස් නිලධාරින් සඳහා ප්‍රතිලාභ ගෙවීමට බලපානු ලබන විධි විධාන/රෙගුලාසි සංශෝධනය කිරීමට රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම්වරයාට අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව බලය පැවරේ.

4.10 මෙම චක්‍රලේඛයේ ඡේද අංක 2 යටතේ හිමිකම් ලබන එහෙත් මේ වන විට සේවයේ යෙදී සිටින සාමාජිකයින් විශ්‍රාම ගැන්වීමට මාස 06කට පෙර මෙම දීමනාව සඳහා ඉල්ලුම් කළ යුතුය. තවද, ඉහත ඡේද අංක 2 යටතේ හිමිකම් ලබන එහෙත් මේ වන විට සේවයේ යෙදී සිටින සාමාජිකයින් අතරින් මෙම චක්‍රලේඛය නිකුත් වන දිනට මාස 06 සම්පූර්ණ කිරීමට නොහැකි සාමාජිකයින් සඳහා පමණක්

විශේෂිත තත්ත්වයක් සේ සලකා මෙම දීමනාව සඳහා ඉල්ලුම් කිරිමට අවස්ථාව සලසා දිය යුතුය. මෙම සාමාජිකයින්හට වෛද්‍ය හේතූන් මත අනිවාර්ය විශ්‍රාම ගැනීමට අනුමැතිය ලැබී තිබිය යුතු අතර වෛද්‍ය මණ්ඩලයක් විසින් ආබාධිත ප්‍රතිශතය තීරණය කිරීමෙන් අනතුරුව ත්‍රිවිධ හමුදාධිපතිවරුන්ගේ හෝ පොලිස්පතිගේ පෞද්ගලික නිර්දේශය සමඟ ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමුකර අනුමැතිය ලබාගැනීමෙන් පසුව පමණක් ගෙවීම් කළ යුතුය.

4.11 2009.05.19 දිනට පෙර සෘජුවම යුද්ධයට දායක වීම හේතුවෙන් ආබාධිතව උක්ත ඡේද අංක 2 යටතේ හිමිකම් ලබන නමුදු දුබලතා ප්‍රතිශතය 20%ට අඩු වූ සාමාජිකයින් නැවත වෛද්‍ය මණ්ඩලයක් මඟින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව දුබලතා ප්‍රතිශතය 20%ක් හෝ 20% ඉක්මවා ඇත්නම් පමණක් එවැනි සාමාජිකයින්ට ද මෙම හිමිකම ලබාදීමට කටයුතු කළ යුතුය.

4.12 ස්ථාවර මාසික දීමනාව ලබා දීමට සුදුසුකම් ලබන ත්‍රිවිධ හමුදා සහ විශේෂ කාර්ය බලකාය ඇතුළු ශ්‍රී ලංකා පොලිස් සාමාජිකයින් නිශ්චිත වශයෙන් හඳුනා ගැනීමෙන් පසු ඔවුන්ගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් ආරක්ෂක අමාත්‍යාංශය, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සහ මහා භාණ්ඩාගාරය වෙතද පිවිසුම් සහිතව යාවත්කාලීන කරමින් පවත්වාගෙන යා යුතු අතර එම දත්ත පද්ධතිය 2020 ජනවාරි මස 01වන දින වන විට සම්පූර්ණ කළ යුතු අතර, එම පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2020 දෙසැම්බර් 31 දිනට පෙර අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කළ යුතුය.

4.13 මෙම චක්‍රලේඛය මුදල් අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ එකඟතාවය ඇතිව නිකුත් කරනු ලැබේ.

**කමල් ගුණරත්න ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී**
මේජර් ජෙනරල් (විශ්‍රාමික)
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

**පිටපත්:-**

I. ජනාධිපති ලේකම් - ජනාධිපති ලේකම් කාර්යාලය - කරු. දැ.ගැ.ස
II. අමාත්‍ය මණ්ඩල ලේකම් - අමාත්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය - කරු. දැ.ගැ.ස
III. ලේකම් - මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස
IV. ලේකම් - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය -කරු. දැ.ගැ.ස
V. විගණකාධිපති - ජාතික විගණන කාර්යාලය -කරු. දැ.ගැ.ස
VI. අධ්‍යක්ෂ ජනරාල් - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව - කරු. දැ.ගැ.ස

ඇමුණුම -I

<u>ආබාධිතව වයස අවුරුදු 55 සම්පූර්ණ වීමට ප්‍රථම සේවයෙන් ඉවත් වූ නිලධාරියකුට වයස අවුරුදු 55 සම්පූර්ණ වූ දින සිට ස්ථාවර මාසික දීමනාව ගෙවීම.</u>

**ආබාධිතව සේවයෙන් ඉවත් වූ නිලධාරියකු අවුරුදු 55 සම්පූර්ණ වීමේදී ලබාගන්නා වැටුප් හා දීමනා**

| හිමි දීමනා | නිලධාරි | සෙසුනිල |
|---|---|---|
| මූලික වැටුප | 61,201.00 | 30,801.00 |
| සලාක දීමනාව | 23,231.10 | 19,350.00 |
| දිරි දීමනාව | 850.00 | 500.00 |
| ගෙවල් කුලී දීමනාව | 8,500.00 | 6,300.00 |
| විශේෂ දුෂ්කර දීමනාව | 3,000.00 | 2,400.00 |
| ජීවනාංක දීමනාව | 7,800.00 | 7,800.00 |
| ගැලපුම් දීමනාව | 9,265.00 | 9,649.00 |
| සුදුසුතා වැටුප | 637.50 | 425.00 |
| මාසික අතුරු දීමනාව | 1,000.00 | 1,000.00 |
| නැවත බැඳීමේ වැටුප | - | 300.00 |
| යහපත් පැවැත්මේ දීමනාව | - | 489.00 |
| **සේවා විශ්‍රාම වැටුප** | **10,203.75** | **2523.60** |
| **දුබලතා විශ්‍රාම වැටුප** | **4,025.00** | **4025.00** |
| **සම්පූර්ණ එකතුව** | **129,713.35** | **85,143.20** |

**වයස අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් පසු හිමි විශ්‍රාම වැටුප**

| හිමි දීමනා | නිලධාරි | සෙසුනිල |
|---|---|---|
| ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප | 71,458.46 | 43,303.76 |

**ස්ථාවර මාසික දීමනාව ගණනය කිරීම**

| හිමි දීමනා | නිලධාරි | සෙසුනිල |
|---|---|---|
| වයස අවු. 55 සම්පූර්ණ වීමේදී ලද වැටුප් හා දීමනා | **129,713.35** | **85,143.20** |
| වයස අවු. 55 සම්පූර්ණ වීමෙන් පසු හිමි මාසික විශ්‍රාම වැටුප | **71,458.46** | **43,303.76** |
| **ස්ථාවර මාසික දීමනාව** | **58,254.89** | **41,839.44** |